Cambridge Assessment International Education

# Cambridge O Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2020**

INSERT **1 hour 30 minutes**

*4848015359-I*

**INFORMATION**

- This insert contains the reading passage.
- You may annotate this insert and use the blank spaces for planning. **Do not write your answers** on the insert.

This document has **2** pages. Blank pages are indicated.

KI 189974/2

© UCLES 2020

[Turn over

https://xtremepape.rs/

Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–13** on the Question Paper.

ඉතා ඈත අතීත කාලයේ දී, පොතපත භාවිතයට පැමිණෙන්නට පෙර, රජවරුන්ගේ තීරණ දැනුම් දීම සඳහා මෙන්ම වැදගත් වූ සිදුවීම් මහජනයාට දැනුම් දීම ආදී වූ විවිධ අවශ්‍යතා සඳහා ලිවීම යොදා ගැනුණි. කඩදාසි මුලින්ම හඳුන්වා දීමට පෙර යම් ලේඛනයක් ලිවීම සඳහා යොදා ගැනුණු දෙය තීරණය වූයේ එකී රචකයාගේ සමාජ තත්ත්වය මත ය. දුප්පත් රචකයන් ලී හෝ ගල් පතුරු වැනි දේ ඒ සඳහා යොදා ගත් අතර ධනවත් රචකයෝ රන්, රිදී හෝ තඹ තහඩු ඒ සඳහා යොදා ගත්හ. චීනයේ, ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ මෙවැනි පැරණි ශිලා ලිපි දහස් ගණනින් හමුවී තිබේ.

පසු කාලයේ මෙකී දේශයන්හි ඉතා බහුල ලෙස ලිවීම සඳහා භාවිතා කළේ තල්පත් ය. එය එසේ ජනප්‍රිය වීමට හේතු වූයේ ඒවා සැහැල්ලු වීම පමණක් නොව, දිගු කල් පැවතීමේ ස්වභාවයයි. අනෙක් අතට, ග්‍රීසිය හා ඉතාලිය වැනි බටහිර රටවල මිනිසුන් ලිවීම සඳහා භාවිතා කළේ පැපිරස් පත්‍ර, සත්ව සම් සහ මැටි පුවරු වූ අතර ඊට මූලික හේතුව වූයේ එවැනි දේ ඔවුන්ට පහසුවෙන් සොයාගත හැකි වීමයි.

ශ්‍රී ලංකාව වැනි රටවල ලිවීමට යොදා ගැනුණු තල් කොළ හඳුන්වනු ලැබුයේ පුස්කොළ යනුවෙන් වූ අතර ඒවා වැවුනේ මීටර් 25 පමණ උසට හැදුනු මෙන්ම වසර 40ත් 100ත් අතර කාලයක් ජීවත් වන තල ගස් වලය. (මීටර් තුනත් හයත් අතර දිගට වැඩුණු ) තල ගොබ ඉරී නොයන පරිද්දෙන් ඉතා ප්‍රවේශමෙන් පළපුරුදු අය විසින් කපා ගත යුතු ය. එම කොළ වේලා, වතුරින් තෙත් කොට දඟර ගසා ගත යුතු ය. ඒවා පැපොල් යුෂ, පැපොල් තලප සහ අන්නාසි කොල සමගින් භාජනයක දමා තම්බා ගත යුතු ය; එසේ කිරීමෙන් මෙම පත්‍ර සිනිඳු වේ. මේවා වියලා ගැනීමෙන් පසු, භාවිතයට ගැනීමට පෙර ඒවායේ මතුපිට ඇට වර්ගයත් යොදා දිලිසෙන මට්ටමට ඔප දමා ගත යුතුය.

ක්‍රිස්තු පූර්ව 1 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ භික්ෂුන්වහන්සේලා 500 එක් වී බුදුන් වහන්සේ ගේ දේශනා සියල්ල ලිවීමේ විශාල කාර්යය ඉටුකළේ ඒවා කටින් කට රැගෙන යාමේ සම්ප්‍රදාය අවදානම් සහගත වූ බැවිනි. උන්වහන්සේ ලා ලෙන් විහාරයක් තුළ වැඩ කරමින්, පන්හිඳ නම් ලෝහ මෙවලමක් භාවිත කරමින් පුස්කොළ පත් වල ලියූහ. පාරම්පරික කැටයමින් පන්හිඳේ මිට අලංකාර කොට තිබුණි.

එසේ ලිවීම අවසන් වූ පසු, පොතක් ලෙසට එම පුස්කොළ බඳිනු ලද්දේය. පුස්කොළ පොත් අද පවතින පොත් වලින් බොහෝ වෙනස් ස්වරූපයක් ගත්තේ ඒවායේ පිටු සෙන්ටිමීටර් 5ත් 7ත් පමණක් පළල් වූ නිසාත්, ඊට අමතරව ඒවා බොහෝ දිගු -එනම් සෙන්ටිමීටර් 60 පමණ වූ නිසාත් ය. ඒවායේ පිටු එකට තබා, තැන් දෙකකින් සිදුරු කොට එම සිදුරු තුළින් නූලක් දමා පිටු එකට සිටින සේ බැඳ තැබිණි. එම ලියැවිලි කියවීම සඳහා, එම නූල ලිහිල් කලයුතු විය. පුස්කොළවල ආරක්ෂාවට විසිතුරු කළ ලී පතුරු බැඳ තිබුණි.

18 වැනි සියවසෙන් පසු, ලිවීමට භාවිත කළ සාම්ප්‍රදායික ක්‍රමය වෙනුවට, කඩදාසි සහ මුද්‍රණ ආයතන සොයා ගැනිණි. කාලයක් යනවිට ලිවීම දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද අත්‍යවශ්‍ය දෙයක් විය. මිනිසුන්ට ද එය අත්‍යවශ්‍ය විය.

අද ද ජ්‍යොති ශාස්ත්‍රඥයන් විසින් පුස්කොළ භාවිත කරන්නේ ඒවායේ රූපකොටු සහ සලකුණු සටහන් කිරීම සඳහා ය. මේවා බලා කෙනෙකුගේ කේන්දරය ප්‍රකාශ කිරීමට ඔවුන්ට හැකිය.

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge Assessment International Education Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cambridgeinternational.org after the live examination series.

Cambridge Assessment International Education is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which itself is a department of the University of Cambridge.



https://xtremepape.rs/